අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බාහිර පාඨමාලා ව්‍යාපෘති ආදායම් කාලපරිච්ඡේදය අනුව හඳුනා නොගෙන එම ව්‍යාපෘතියේ වර්ෂයේ වියදම වන රු. 7,530,559කට සමාන වටිනාකමක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලා ආදායම රු. 14,886,741ක් වූ අතර විශ්වවිද්‍යාලය විසින් දිගින් දිගටම මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හේතුවෙන් බාහිර පාඨමාලා ව්‍යාපෘති ආදායම් ගිණුමේ සමුච්චිත ශේෂය රු. 19,405,271ක් වී තිබුණි.

ආ) ඉගෙනීම් කටයුතු සඳහා දරන ලද වියදම් හා අනෙකුත් අධ්‍යාපන කටයුතු සඳහා දරන ලද වියදම් ක්‍රමක්ෂය (Amortize) කළ යුතු වුවත් ජංගම නොවන වත්කම් යටතේ

ගිණුම්ගත කර තිබුණු රු. 1,900,263ක් වූ නිපුණතා සංවර්ධනය වියදම ක්‍රමක්ෂය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශනයේ දක්වෙන සම්පූර්ණයෙන් ක්ෂය වී තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන රු. 3,967,951ක් වූ වත්කම් 03ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වූ නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු. 173,002,862ක් වූ ගිණුම්කරණ අඩුපාඩු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වෙත 2013 අප්‍රේල් 19 දිනැති 13(7)(ඒ) සවිස්තර වාර්තාව මගින් යොමු කරන ලද අතර එම අඩුපාඩු වලින් රු. 14,639,113ක් නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 17 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් මත රඳවාගැනීම් ශේෂය වූ රු. 12,252,176ක් තුළ වර්ෂ දෙකකට වඩා පැවති ශේෂය රු. 11,172,763ක් වූ අතර මෙම මුදල තුළ 2005 සිට 2007 දක්වා කොන්ත්‍රාත් දෙකකින් රඳවා ගත් මුදල රු. 10,880,640ක් විය. එම කොන්ත්‍රාත් නියමිත කාල වකවානු වලදී ඉටුකර අවසන් වී නොතිබුණි.

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) විවිධ ණයහිමියන්හි ඇතුළත් රු.483,450ක්වූ සේවා තැන්පත් සහ රු. 257,040ක් වූ ආරක්ෂක තැන්පත් සඳහා ශේෂ තහවුරු කිරීම් හෝ මුදල් ගෙවූ බවට වූ කුවිතාන්සි ඉදිරිපත් නොකෙරුණි.

ආ) මූල්‍ය ප්‍රකාශන වල දක්වෙන රු. 142,270,681ක පුනරාවර්තන වියදම් (බාහිර ව්‍යාපෘති වියදම් ඇතුළුව) සඳහා වූ ලෙජර් ගිණුම් විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම වියදම් ගිණුම්ගත කිරීමේ හා වර්ගීකරණය කිරීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට සාක්ෂි නොවිනි.

**2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය | |
| XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | උසස් අධ්‍යාපන ආයතනවලට අයත් සියලුම භාණ්ඩ හා ස්ථාවර වත්කම් පිළිබඳව පත්කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් වාර්ෂිකව හරි වැරදි බැලීම් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු. 13,434,024ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණය සිදු කර තිබුණද අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි |
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදලට සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2011 අගෝස්තු දක්වා රු. 4,155,912/- ක මුදල වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දින හා අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2012 මැයි 29 දින පැවති 325 වැනි පාලක සභා තීරණය | දේශන සඳහා සියයට 80ට වඩා සහභාගී වූ සිසුන් පමණක් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා පාලක සභාව විසින් අනුමත කර තිබුණි. ඊට පටහැනිව නේවාසික විශ්වවිද්‍යාලයක් වන මෙම විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ පැමිණීම සියයට 40 සිමාව දක්වා අඩු කර විභාගයට පෙනී සිටීමට අභියාචනා අධ්‍යයන කමිටුව අවසර ලබා දී තිබියදී සියයට 40ක පැමිණීමේ ප්‍රතිශතය නොමැති සිසුන් 7 දෙනෙකු වෙතද විභාගය ලිවීමේ අවසරය ලබා දී තිබුණි. |

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය, පුනාරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.129532400/- ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ ඊට අනුරූප ඌනතාවය රු.154471836/- ක් වූයෙන් ඌනතාවයේ රු.24939436/- ක අඩු වීමක් නිරීක්ෂනය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 119347880/- ක් වූ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.10184520/- ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.62152897/- ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු.51968377/- ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා රජයේ ආධාර රු. 27028941/ක් වැඩියෙන් ලැබීම සහ රජයේ ප්‍රතිපාදන රු. 47534691 කින් ක්‍රමක්ෂය කිරීම මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ.)

ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම මූලික අරමුණ වන අතර සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ හතරකදී සාමාන්‍ය උපාධි සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ඉල්ලුම් කල හා බඳවා ගත් දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලුම් කල සංඛ්‍යාව | | බඳවා ගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| 2008 | 293 | 61 | 109 | 61 |
| 2009 | 196 | 74 | 109 | 74 |
| 2010 | 353 | 45 | 109 | 45 |
| 2011 | 305 | 48 | 110 | 48 |
| 2012 | 379 | 46 | 107 | 36 |

2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම 2012 නොවැම්බර් 08 දින සිදු කර තිබුණි. මේ හේතුවෙන් 2012 වර්ෂයේ පළමු වසරේ පාඨමාලා 2013 වසරේ ආරම්භ කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි ප්‍රායෝගික, ඵලදායී පුහුණු වැඩපිළිවෙලක් සැලසුම් කර විශ්වවිද්‍යාලීය උපාධි විෂයධාරා තුළට ඇතුළත් කර නොතිබුණි. 1984 සිට 2012 දක්වා කාල සීමාව තුළ ආචාර්ය, දර්ශනපති, ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා ආදී විභාග සමත් වූවන් 6283ක් බිහිකර ඇතත් ඉහත අරමුණු කරා ළඟාවීම පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් පසුවිපරම් කර නොතිබුණි.

**4.2 ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 359 ක් වෙනුවෙන් දරන ලද මුලු පුනරාවර්තන වියදම රු.189805371/- ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.528706/- ක් විය. ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 519ක් වෙනුවෙන් දරණ ලද මුලු පුනරාවර්තන වියදම රු.167851717/- ක් හා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 323414/- ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එක ශිෂ්‍ය පිරිවැය රු. 205292/-කින් එනම් සියයට 63.48% කින් වැඩි වී තිබුණි.

**4.3 කළමනාකරණ අකාරක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ විධිවිධාන සහ 2011 අයවැය මඟින් ඊට යෝජිත සංශෝධනයන්ට අනුව රාජ්‍ය ආයතනවල මාසිකව නිත්‍ය සේවා නියුක්ති ලාභ රු.50,000/- ක් හෝ වර්ෂයකට රු. 600,000/- කට වැඩියෙන් ලබන සේවා නියුක්තිකයින් 2011 වර්ෂයේ අප්‍රේල් 01 සිට උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ලියාපදිංචි කර, බදු අඩු කර දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු වුව ද 2011 හා 2012 යන වර්ෂ වලට අදාල බදු මුදල් අඩු කර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ආ) 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 45 ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් 2011 වර්ෂය සඳහා නිළධාරීන් 24 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා රු. 2,986,800ක් ගෙවා තිබුණි. උක්ත චක්‍රලේඛයේ 4(අ) ජේදයේ ප්‍රකාරව 2012 වර්ෂය අවසන් වන විට අදාළ කමිටුව වෙත පර්යේෂණ වාර්තා 05ත් ඉදිරිපත් කර තිබුණු අතර එම වගන්තියේ සඳහන් වන අවශ්‍යතාවයන් ඉටු කළ බවට සාක්ෂි නොතිබූ නිළධාරීන් 24 දෙනෙකු වෙත රු. 3,371,085/- ක පර්යේෂණ දීමනා 2012 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණි.

**4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

බෞද්ධ අධ්‍යයනයට හා පාලි භාෂාවට පමණක් සීමා වූ පර්යේෂණ වලට ආධාර කිරීම සඳහා පිහිටුවා තිබූ ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල 2006 න් පසුව අදාළ අරමුණ ඉටු කර ගැනීම සඳහා යොදවාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ශේෂය රු. 1824024/-ක් විය.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ.) ශිෂ්‍යත්ව, ත්‍යාග හා වෙනත් අරමුදල් වලින් අරමුණු ඉටු කර ගැනීමට ප්‍රමාණවත් මුදලක් ඉතිරි කිරීමේ ගිණුම් වල රඳවාගෙන ඉතිරිය ආයෝජනය කර ආදායමක් උපදවා ගැනීමට කළමණාකරන කටයුතු කළ යුතු වුවත් ඉහත බැංකු ගිණුම් වල වර්ෂය අවසානයේ පැවති රු. 5655459/- ක් වන ශේෂය ඵලදායී ලෙස යොදවා නොතිබුණි.

(ආ.) 2011 හා 2012 අධ්‍යයන වර්ෂ වල විභාග ප්‍රතිඵල සැලසුම් කළ පරිදි නිකුත් නොකිරීම නිසා ත්‍යාග හා ශිෂ්‍යත්ව පිරිනැමීමේදී මාස 06 සිට මාස 18 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

**4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

2004 වර්ෂයේ සිට රු. මිලියන 512ක් වැය කර සියළු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණ ද ඊට සාපේක්ෂව වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. 2012 වර්ෂයේදී සිසුන් 379 දෙනෙකු ඉල්ලුම් කලද බඳවා ගෙන තිබුණේ සිසුන් 107 දෙනෙකු පමණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **ගොඩනැගිලි ඉදිකිරීම**

සංයුක්ත සැලැස්මෙන් 2012 වර්ෂයේ ඉටු කර ගැනීමට යෝජිත ගොඩනැගිලි ඉදි කිරීමේ ව්‍යාපෘති සඳහා වර්ෂයේ මූලධන ඇස්තමේන්තුවෙන් රු.මි. 234.5 ක් භාණ්ඩාගාරය විසින් වෙන් කර තිබුනද විශ්වවිද්‍යාලයට එය ඉටු කර ගත නොහැකි වී තිබුණි. එම කටයුතු ඉදිරි වර්ෂයන්හිදි හෝ ඉටු කර ගැනීමට අවශ්‍ය පරිදි 2012 - 2016 සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **පුස්තකාල කටයුතු**

2012 - 2016 සංයුක්ත සැලැස්මෙහි 2012 වර්ෂයේදී පුස්තකාලයට අදාළව ඉටු කර ගැනීමට අපේක්ෂා කළ ක්‍රියාකාරකම්හි ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් සකස් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම සහ අන්තර්ජාල සේවා පුළුල් කිරීමද සිදු කර නොතිබුණි.

**5.2 අයවැය පාලනය**

ඉඩම් හා ගොඩනැගිලි අත්පත් කර ගැනීම සඳහා රු. 101920000/-ක් අයවැයෙන් වෙන්කළද එම කාර්යයන් යුහුසුළුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු. 50000000/- ක් මු.රෙ. 66 මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාරු කරගෙන තිබුණි.

**6. පද්ධති හා පාලන.**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) පුස්තකාල කළමනාකරණය
(ඇ) ඉදිකිරීම්

(ඈ) මානව සම්පත් කළමනාකරණය (ඉ)
(ඉ) බාහිර ව්‍යාපෘති වලට අදාළ ගිණුම්කරණය
(ඊ) වාහන පාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

බීපීයූ/අයිඒබී/එෆ්ආර්/2012

2013.12.30

එච්. ඒ. එස්. සමරවීර මහතා,
විගණකාධිපති.
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**උක්ත විගණකාධිපති වාර්තාව 2012.12.24 දින පැවති මෙම විශ්වවිද්‍යාලයේ 342 වන පාලක සභාවේ දී සළකා බැලීමෙන් අනතුරුව එම වාර්තාවේ දැක්වෙන එක් එක් නිරීක්ෂණ සම්බන්ධ පැහැදිලි කිරීම් පහත දක්වමි.**

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්**

අ) 2013 වර්ෂයට අදාළ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී බාහිර ව්‍යාපෘතිවල ආදායම් හා වියදම් එම පාඨමාලාවල කාල පරිච්ඡේදය අනුව වෙන් කර හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් මේ වන විට අවසන්ව ඇති ව්‍යාපෘතිවල සමුච්ත ශේෂ හඳුනාගෙන ආදායමට ගැනීමටත් කටයුතු කරමි.

ආ) නිපුණතා සංවර්ධනය සඳහා වන වියදම් ප්‍රාග්ධන වියදමක් සේ සැළකීමට තීරණය කර ඇති බැවින්, එම වියදම 2012 වර්ෂයේ සිට ගැලපෙන පරිදි වර්ෂ 03ක් තුළ දී ක්‍රමක්ෂය කිරීමට තීරණය කර ඇත.

2'2' 2 .sKqïlrK m%;sm;a;s

මෙම වත්කම් තුළ ඇතුළත් උපාධි ලෝගු ප්‍රත්‍යාගණනය කර අවසන් කර ඇති අතර අනෙකුත් දැව භාණ්ඩ හා කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

2'2' 3 .sKqïlrK wvqmdvq

මෙම ඡේදයෙහි දක්වා ඇත්තේ වාර්තාවේ දක්වා ඇති ගිණුම්කරණ අඩුපාඩුවල එකතුවක් බැවින් ඒ ඒ ඡේද යටතේ දක්වා ඇති පැහැදිලිකිරීම් අදාළ වේ.

2'2' 4 ,eìh hq;= yd f.úh hq;= .sKqï

අ) 2013 වර්ෂය තුළ CECB ආයතනයට ගෙවිය යුතු බිල්පත් වලින් රු. මිලියන 4.5 ක බිල්පත් නිරවුල් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

2'2' 5 ú.Kkh i|yd idlaIs fkdùu

අ) අදාළ ලිපි ලේඛන විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

ආ) 2013 ගිණුම් වර්ෂයේ දී නිවැරදිව ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

2'2' 6 kS;s" ß;s" fr.=,dis yd l<ukdlrK ;SrKhkag wkql+, fkdùu

**අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය**

**I.** XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය

කොළඹ හා හෝමාගම පුස්තකාල පරිශ්‍ර සමීක්ෂණය අවසන් කර, සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇත.

**ආ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය**

දැනට ලේඛන පිළියෙල කරමින් පවතින අතර ඉදිරියේ දී මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමි.

**ඇ) 2002 නොවැම්බර් 28 දින හා අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය**

පරිගණක හා උපාංගවල අවශ්‍ය මූලික තොරතුරු ඒ ඒ අංශවල වෙන වෙනම පවත්වාගෙන යනු ලබන ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුලත් කර ඇත.

**ඇ) 2012 මැයි 29 දින පැවති 325 වැනි පාලක සභා තීරණය**

සිසුන්ගේ පැමිණීමේ 40%ක ප්‍රතිශතය නොමැතිව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 07 දෙනෙකු නොව 06 පමණක් බව පෙන්වා දෙමි. එයින් සිසුන් 04 දෙනෙකු විශ්වවිද්‍යාලයේ 2011.11.15 වන දින සිදු කළ විනය විරෝධී ක්‍රියාවට සම්බන්ධ චෝදනා ලබා තාවකාලිකව පන්ති තහනමකට ලක් වූ සිසුන් වේ. පසුව විනය පරීක්ෂණ ප්‍රතිඵල මත නැවත දේශන වලට සහභාගී වීමට හා විභාග වලට පෙනී සිටීමට අවසර ලබා දී ඇත. ඉතිරි එක් සිසුවෙකුට වෛද්‍ය හේතුන් මත විභාගයට පෙනී සිටීමට අවසර ලබා දී ඇත. ඉතිරි අනෙක් ශිෂ්‍යයාට ඔහු හදාරන ලද උපාධි පාඨමාලාවේ එක් විෂයකට 80% ක ප්‍රතිශතය නොමැති බව දන්වා, ඒ සඳහා අදාළ අංශ ප්‍රධානගේ අනුමැතිව මත එම විෂය සඳහා වූ විභාගයට පෙනී සිට ඇත. ඒ අනුව ඉහත සඳහන් සිසුන් 06 දෙනාගේ පස් දෙනෙකු සඳහා පැමිණීමේ ප්‍රතිශතය සළකා බැලීමට හැකියාවක් නොමැති අතර එක් සිසුවෙකු සඳහා පමණක් ඔහුලේ පාඨමාලාවේ එක විෂයකට එම සිසුවා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැළකිල්ලට ගෙන අදාළ අධ්‍යනාංශ ප්‍රධාන අනුමැති දී ඇත

3 uQ,H iudf,dapkh

3'1 uQ,H m%;sM,

4 fufyhqï iudf,dapkh

4'1 ld¾hh idOkh

අ) උසස් අධ්‍යාපන අමාත්‍යංශයෙන් අනුමැතිය ලබා දී ඇත්තේ සිසුන් 110 ක් බඳවා ගැනීමට පමණි. එලෙස බඳවා ගැනීම සීමා වී ඇත්තේ 1995 අංක 37 දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත ප්‍රකාරව බඳවා ගන්නා සියලුම සිසුන්ට නේවාසික පහසුකම් ලබා දිය යුතු බැවිනි.

2012 වර්ෂයට සිසුන් බඳවා ගැනීමට මෙම විශ්වවිද්‍යාලය අවශ්‍ය කටයුතු කරමින් තිබුණ ද උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිසුන්ට ලබා දිය යුතු නායකත්ව පුහුණුව ලබා දිය යුතු බවට තීරණය වූ බැවින් එකී පුහුණුව ලබා දීමෙන් පසුව බඳවා ගන්නා ලදී. මේ නිසා බඳවා ගැනීම කෙටිකාලයකට ප්‍රමාද විය.

ආ) බුදු දහම පතුරවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම මෙන්ම බුද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම විශ්වවිද්‍යාලය පිහිටුවීමේ මූලික අරමුණයි.
ඒ සඳහා විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම එයට ක්‍රියාකර ඇති බවට සඳහන් කළ යුතුය. එය අංශ කිහිපයකින් ඉටුකර ඇත.

1. විදේශීයයන් අතර බුදුදහම පිළිබඳව ප්‍රචාරණය සම්බන්ධයෙන් ආරම්භයේ සිටම විශ්වවිද්‍යාලයට අනුබද්ධව ආයතන ආරම්භ කර එම ආයතන මඟින් බුදු දහම පිළිබඳව අවබෝධයක් ලබා දීමට ක්‍රියාකිරීම. මේ සඳහා විදේශීය අනුබද්ධායතන 10 ක් පිහිටුවා ඇත. බෞද්ධ පාඨමාලා ආරම්භ කර ඩිප්ලෝමා, උපාධි හා පශ්චාත් උපාධි ලාභීන් බිහි කර ඇත.

2. විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස පාඨමාලාවන් සංශෝධනය කරමින් ධර්ම සන්නිවේදකයන් වහන්සේලා බිහිකිරීමට උචිත නොයෙකුත් පාඨමාලාවන් හඳුන්වා දී ඇත.
   - ධර්ම සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව
   - විදේශ ධර්මදූත සන්නිවේදන පශ්චාද් උපාධි පාඨමාලා
   - වෛද්‍ය උපදේශන පාඨමාලා
   - ජ්‍යොතිර්වේදය පිළිබඳ පාඨමාලා

3. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්‍රියාකාරකම් වලට සමගාමීව සිසුන්ගේ දක්ෂතාවයන් වර්ධනයට උචිත පරිදි ශිෂ්‍යයත්ව පිරිනැමීමත් වාර්ෂිකව සිදු කෙරේ. විශ්වවිද්‍යාලයේ වැඩිම ලකුණු ලබා ගන්නා සිසුන්ට ඉංග්‍රීසි භාෂාවෙන් ධර්ම දේශනා කිරීමේ වැඩ සටහන් ආදී වශයෙන් ක්‍රියාත්මක කිරීම තුළින් සිසුන් උනන්දුකර වීම.

4. සිසුන් මඟින් විශ්වවිද්‍යාලය අවට ජනතාවට ප්‍රයෝජනවත් වැඩ සටහන් සංවිධානය

කරවීම. ශිෂ්‍ය සාහිත්‍ය උත්සව, රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් රෝහල්, ප්‍රජා සත්කාරක සේවා, ලේ දන්දීමේ වැඩසටහන්, පිරිවෙන් වල ඉගෙනුම ලබන ශිෂ්‍යන් සඳහා පිරිවෙන් අවසාන සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ආදී වශයෙන් ශිෂ්‍යයන්ගේ පෞරුෂය සංවර්ධනයට ඉඩකඩ විෂය සමගාමීව විශ්වවිද්‍යාලය විසින් සපුරා දී ඇත.

5. විශ්වවිද්‍යාල ආචාර්යභවතුන් වෙත බෞද්ධ ධර්මය පිළිබඳ විවිධ පර්යේෂණ සිදුකිරීමට පහසුකම් සළසා ඇත.

6. දැනට විශ්වවිද්‍යාලයෙන් බිහිවන උපාධිධාරීන් පිළිබඳ සමීක්ෂණයක් පවත්වා එම සිසුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර පිළිබඳව සොයා බැලීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

7. නූතන ලෝකයට ගැලපෙන පරිදි විෂය නිර්දේශ සංශෝධන කිරීම තුලින් සිසුන්ට නව දැනුම හා හැකියාවන් වර්ධනය කර ගැනීමට ඉඩ සලස්වා ඇත.

ඒ අනුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ක්‍රියාවලිය පිළිබඳ විශ්වවිද්‍යාලයට ප්‍රාමාණික වශයෙන් සෑහීමකට පත් විය හැක.

## 4'2 YsIH msßjeh

2012 වර්ෂය සඳහා සිසුන් බඳවා නොගත් හේතුවෙන් හා මෑතකාලයේදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නඩත්තු වියදම් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම නිසා ද ඒකක ශිෂ්‍ය පිරිවැය වැඩි වී ඇත.

## 4'3 l<ukdlrK wld¾hlaIu;d

අ) 2012 වර්ෂයට අදාළ බදු මුදල් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර අවසන් අතර 2011 වර්ෂ වලට අදාළ අඩුකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

ආ) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා පර්යේෂණ දීමනා ගෙවීමේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2011.04.20 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛයේ වගන්ති 03 (III) යටතේ වූ ප්‍රතිපාදන අනුව සිදු කර ඇති බව පෙන්වා දෙමි.
මෙහිදී මෙම විශ්වවිද්‍යාලයේ 2011.06.14 දින පැවති 154 වන සනාතන සභා අනුමැතිය යටතේ ස්ථාපිත කරන ලද පර්යේෂණ කමිටුව වෙත අදාළ සියලුම අධ්‍යයන කාර්යය මණ්ඩල විසින් ඉදිරිපත් කරනු ලැබූ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර ඇගයීමකට ලක් කර ඇති අතර, එම කමිටු නිර්දේශ හා පාලක සභා අනුමැතිය මත අදාළ පර්යේෂණ දීමනා ගෙවීම් කර ඇත.

## 4'4 fufyhqï wld¾hlaIu;d

අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පර්යේෂණ දීමනා ද ගෙවමින් පවතින බැවින් ඔවුන් ඒ සඳහා දැනටමත් පර්යේෂණ කටයුතු වල නිරතව ඇත. මෙම පර්යේෂණ ආධාර ඉල්ලුම් නොකිරීම නිසා මෙය අකර්මන්‍යව පවතී. දැනට ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලෙන් රු 1300,000/- ක් ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කර ඇති අතර, පර්යේෂණ සඳහා මෙම මුදල යොදා අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.

## 4'5 wruqo,a W!k Wmfhdackh

අ) දනට ජීයුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදලින් රු.1300,000/- ක් මුදලක් ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කර ඇති අතර මහෝපාධ්‍යායය අරමුදලින් මිලියන 3.5 ක් ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කර ඇත.

ආ) 2011 වර්ෂ අවසාන විභාග පරීක්ෂණ 2011.10.24 දින සිට 2011.12.02 දින දක්වා පැවැත්වීමට තීරණය කර තිබුණ ද සිසුන් අතර ඇති වූ ගැටුම්කාරී තත්ත්වයක් මත විශ්වවිද්‍යාලය දින නියමයකින් තොරව වැසීමට සිදු විය. අනතුරුව පාලක සභා තීරණය අනුව 2011 පැවැත්වීමට නොහැකි වු විභාග 2012 වර්ෂයේ දි පවත්වන ලදී.
2013 මැයි මස පැවැති සනාතන සභා නිර්දේශ මත 2013.06.05 දින ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිතව තිබුණ ද 2013.06.04 දින සිට නැවත වරක් විශ්වවිද්‍යාලය වැසීමට සිදු විය. අනතුරුව 2013.09.25 දින ආරම්භ කරන ලද විභාග පරීක්ෂණ වලින් පසුව ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.
මෙම ප්‍රමාදය 2011 සහ 2012 අධ්‍යයන වර්ෂවල විභාග ප්‍රතිඵල සැළසුම් කළ පරිදි නිකුත් නොකිරීම නිසා සිදු වූ ප්‍රමාදයක් නොවන බව කරුණාවෙන් දන්වා සිටිමි.

## 4'6 ksYalS%h W!k Wmfhdað; j;alï

2007 වර්ෂයට පෙර සිසුන් බඳවා ගනු ලැබුවේ 50 දෙනෙකු පමණි. එහෙත් ගොඩනැගිලි ඉදිකිරීම් සමඟ දේශීය සිසුන් පමණක් වර්ෂයකට 110ක් බඳවා ගැනුණි. ඒ අනුව වසරකට සිසුන් 60 දෙනෙකුට වැඩි වශයෙන් බඳවා ගෙන ඇත. බඳවා ගැනීම සීමාවන විශ්වවිද්‍යාල පනතේ වගන්ති සංශෝධනය කර වැඩි සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට අවධානය යොමු කර ඇත.

# 5 .sKqï lghq;=Ndjh iy hymd,kh

## 5'1 ixhqla; ie,eiau

අ) ගොඩනැගිලි ඉදිකිරීම

**I. ගොඩනැගිලි ඉදිකිරීම.**

2012 - 2016 සංයුක්ත සැලැස්ම ප්‍රකාරව ඉටුකර ගැනීමට අපේක්ෂිත ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා රු. මිලියන 150 ක් වෙන කර තිබුණි. එහි ක්‍රියාකාරකම් 06 ක් ඉටුකර ගත යුතුව ඇත්තේ අලුතින් ඉඩම් ලබා ගැනීම මතය. විශ්වවිද්‍යාලයට අලුතින් ඉඩමක් ලබා ගැනීමට කටයුතු කර තිබූ අතර විශ්වවිද්‍යාලයට යාබඳ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ඉඩමෙන් අක්කර 02 ක් පවරා ගැනීමට කටයුතු කර තිබුණි. ඉඩම් පවරා ගැනීමේ දී එහි අයිතිය පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පරිපාලනමය ගැටලු හේතුවෙන් විශ්වවිද්‍යාලයට අවශ්‍ය ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය. මෙම ඉඩම විශ්වවිද්‍යාලයට 2013.05.30 දින වන විට පවරා තිබුණි.

අපවිත්‍ර ජලය පරිසරයට මුදා හැරීම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණ ද එම ව්‍යාපෘතිය ඉදිකිරීම CECB ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. ක්‍රියාකාරකම් 02 ක් අවශ්‍ය නොවන බවට හඳුනාගෙන තිබුණි. (ක්‍රියාකාරකම් 10 හා ක්‍රියාකාරකම් 11) ක්‍රියාකාරකම් 12 සඳහා වූ ව්‍යාපෘතිය ඉටු කිරීමට කටයුතු කර තිබුණ ද ඒ සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය එම වසර තුළ දීම ලබා නොදුණි.

ඒ අනුව 2012 වර්ෂයේ දී ඉටුකිරීමට නොහැකි වූ මෙම කාර්යයන් ඇතුලත් කර 2013-2017 සැලැස්ම පිළියෙල කර ඇත.

**II.** **පුස්තකාල කටයුතු**

- **ශාස්ත්‍රීය සංග්‍රහය**
  මේ සම්බන්ධව කටයුතු කරමින් පවතී.

- **එකතු සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශනය**
  මෙයට අදාළ තොරතුරු ප්‍රධාන මාතෘකා 10 ක් යටතේ රැස්කර දැනට පිළියෙල කර ඇත.

- **අන්තර්ජාල සේවා**
  අන්තර්ජාල සේවා පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී.

5'2 whjeh md,kh

5.1 (අ) යටතේ වූ පැහැදිලි කිරීම මෙයට අදාළ වේ.

6' moaO;s yd md,khka'

දක්වා ඇති පාලන ක්ෂේත්‍රයන්හි පවතින දුර්වලතාවයන් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගනිමින් පවතී.

**මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිර**
**මහෝපාධ්‍යායයන් වහන්සේ**

පිටපත් : 01. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යංශය
02. ලේකම් - මුදල් අමාත්‍යංශය

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## <u>අර්ථසාධක අරමුදල</u>
## <u>2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය</u>

<u>(සංඛ්‍යා ආසන්න රුපියලට ගැලපුම් කර ඇත.)</u>

| 2011 | විස්තරය | උපලේඛන | 2012 | |
|---|---|---|---|---|
| රු. | | අංකය | රු. | රු. |
| | <u>01. වගකීම්</u> | | | |
| 38,412,269 | දායක ගිණුම - සේවක | 01 | 44,333,735 | |

| | | | | |
|---|---|---|---|---|
| 57,620,348 | දායක ගිණුම - සේවා | 01 | 66,502,547 | |
| **96,032,617** | | | **110,836,282** | **110,836,282** |
| | 02. සංචිත | | | |
| 7,957 | සමුච්චිත ශේෂය | | | 13,276 |
| **96,040,574** | | | | **110,849,558** |
| | නියෝජනය කරන්නේ | | | |
| | 03. දිගුකාලීන වත්කම් | | | |
| 67,688,441 | භාණ්ඩාගාර බිල්පත් | | 76,797,969 | |
| 26,181,372 | සේවක ණය | 02 | 29,662,230 | |
| **93,869,813** | | | **106,460,199** | **106,460,199** |
| | 04. ජංගම වත්කම් | | | |
| 2,007,061 | ලැබිය යුතු පොලී | | 3,035,651 | |
| 61,789 | රඳවා ගැනීමේ බදු | | 61,789 | |
| 1,957,656 | බැංකුවේ ශේෂය | | 3,977,488 | |
| **4,026,506** | | | **7,074,928** | |
| | 05. අඩු කළා : | | | |
| | ජංගම බැරකම් | | | |
| 144,223 | උපචිත වියදම් | | 244,223 | |
| 1,711,522 | විවිධ ණයහිමියෝ | 03 | 2,441,346 | |
| **1,855,745** | | | **2,685,569** | |
| 2,170,761 | ශුද්ධ ජංගම වත්කම් | | 4,389,359 | 4,389,359 |
| **96,040,574** | | | | **110,849,558** |

මහෝපාධ්‍යාය            මූල්‍යාධිකාරී

පිටිපන උතුර, හෝමාගම.

2013.02.28

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## ආදායම් හා වියදම් ප්‍රකාශනය

| 2011 | විස්තරය | | 2012 | |
|---|---|---|---|---|
| රු. | | | රු. | රු. |
| | 01. ආදායම් | - | | |
| 5,115,357 | භාණ්ඩාගාර බිල්පත් පොලී | | 6,933,499 | |
| 1,300 | මිශ්‍ර ලැබීම් | | 113,668 | |
| **5,116,657** | දළ ආදායම | | **7,047,167** | **7,047,167** |

| | | | | |
|---|---|---|---|---|
| | **02. අඩු කළා : වියදම්** | | | |
| 74,566 | විගණන ගාස්තු | | 129,710 | |
| 3,750 | වෙනත් වියදම් | | - | |
| **78,316** | | | **129,710** | **(129,710)** |
| | | | | **6,917,457** |
| | **අඩු කළා :** | | | |
| 5,038,341 | වර්ෂයේ ආදායම් බදු | | | (693,350) |
| **511,536** | ආදායම් බද්දට පසු අතිරික්තය | | | **6,224,107** |
| **4,526,805** | | | | |
| | **එකතු කළා :** | | | |
| 7,973 | පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | | | 7,973 |
| **4,534,778** | | | | **6,232,064** |
| | **අඩු කළා :** | | | |
| | විසර්ජනයන් | | | |
| | දායක ගිණුම් සඳහා පොලී | | | |
| 1,810,728 | සේවක | - | 2,487,515 | |
| 2,716,093 | සේව්‍ය | - | 3,731,273 | |
| **4,526,821** | | | | **(6,218,788)** |
| 7,957 | ශේෂය ඉ/ගෙ | | | 13,276 |

මහෝපාධ්‍යාය　　　　　　　　　　　　මූල්‍යාධිකාරී

පිටිපන උතුර, හෝමාගම.

2013.02.28

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## අර්ථසාධක අරමුදල

## 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | විස්තරය | ලෙජර් පිටුව | හර | බැර |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| **1.** | දායක ගිණුම - සේවක | **01-10** | - | 44,333,735 |
| **2.** | දායක ගිණුම - සේව්‍ය | **01-11** | - | 66,502,547 |
| **3.** | සමුච්චිත ශේෂය | **02-10** | - | 7,957 |
| **4.** | ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් | **03-10** | 76,797,969 | - |

| | | | | |
|---|---|---|---|---|
| **5.** | සේවක ණය | **03-11** | 29,662,230 | - |
| **6.** | ලැබිය යුතු පොලී | **04-10** | 3,035,651 | - |
| **7.** | රඳවා ගැනීමේ බදු | **04-11** | 61,789 | - |
| **8.** | බැංකුවේ ශේෂය | **-** | 3,977,488 | - |
| **9.** | උපචිත වියදම් | **05-10** | - | 244,223 |
| **10.** | විවිධ ණයහිමියෝ | **05-11** | - | 2,441,346 |
| **11.** | ආයෝජන ආදායම් භාණ්ඩාගාර බිල්පත් | **06-10** | - | 6,933,499 |
| **12.** | දායක ගිණුම් සඳහා බැර කළ පොලිය | **07-10** | 4,218,788 | - |
| **13.** | ආදායම් බදු | **07-11** | 693,350 | - |
| **14.** | විගණන ගාස්තු | **07-12** | 129,710 | - |
| **15.** | වෙනත් වියදම් | **07-13** | - | - |
| **16.** | මිශ්‍ර ලැබීම් | **07-14** | - | 113,668 |
| | | | 120,576,975 | 120,576,975 |

මහෝපාධ්‍යාය මූල්‍යාධිකාරී

පිටිපන උතුර,

හෝමාගම.
2013.02.27

ඊසී/ඊ/බීපීයූ/පීඑෆ්/එෆ්ඒ/12

2013 සැප්තැම්බර් 11

මහෝපාධ්‍යායයන් වහන්සේ,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්සාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1981 අංක 74 කරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 38 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)((ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත 2013 අගෝස්තු 30 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර්ය ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම් කරන ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1 ලැබිය යුතු ගිණුම්**

වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදලේ මුදල් ආයෝජනය කළ මූල්‍ය ආයතනයක් විසින් ආදාළ ආයෝජන ආදායමෙන් නියමිත ප්‍රමාණය ඉක්මවා රු.191,095/-ක් රඳවා ගැනීමේ බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. එව වැඩිපුර ප්‍රේෂණය කළ මුදලින් රු.61,789/-ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

